ප්‍රසිද්ධ ස්ථානයක සාමාන්‍ය ජන ජීවිතයට බාධාවක් වන ලෙසින් දිවි තොර කරගැනීමක් සිදුවූ විටකදී, ප්‍රසිද්ධ පුද්ගලයෙකු හෝ ජනතා නියෝජිතයෙකු දිවි තොර කරගත් විටකදී, නැතිනම් ඝාතනයක් හා දිවි තොර කරගැනීමක් එක විට සිදුවූ මොහොතකදී යන කරුණු වලින් එකක් හෝ කිහිපයක් සිදුවූ විටකදී, එය මහජන ලැදියාවට අදාළ කරුණක් ලෙසින් සැලකිය හැක. එසේම එවැනි දිවි තොර කරගැනීමකට වැඩි මාධ්‍ය අවධානයක් යොමු වීමේ නැඹුරුතාවයක් ද පවතී.

මහජන ලැදියාවට (public interest) අදාළ වන දිවි තොර කරගැනීමේ සිදුවීමක් වාර්තා කිරීමේදී පවා හැකිතාක් ආචාර ධාර්මික වීමත්, ප්‍රවේසම් සහගත වීමත් අවශ්‍ය වන්නෙ ඒ හෙයිනි.

මෙවැනි අවස්ථාවකට උදාහරණයක් ලෙසින් සංවර්ධන නිලධාරිනියක් ගාල්ල බන්ධනාගාරය තුළ දිවි තොර කරගැනීමට උත්සාහ ගත් බවට පැවසෙන පුවත ගත හැක.
1) මෙහි දිවි තොර කරගැනීමට ගත් උත්සාහය දීර්ඝ වශයෙන් සඳහන් කොට ඇත. මෙම සිදුවීමෙහිදී දිවි තොර කරගැනීමට උත්සාහ ගත් ආකාරය මහජන ලැදියාවට අදාළ යැයි කිව හැකි වුවත්, එම ක්‍රමය දීර්ඝ ලෙසින් විස්තර කිරීම අවශ්‍යද යන්න පැනයකි. ඒ ඔස්සේ, දිවි තොර කරගැනීමේ නැඹුරුවක් ඇති අයෙකු අනුකාරක දිවි තොර කරගැනීමකට පෙළඹීමේ අවදානමක් ඇති බව අමතක කළ නොහේ.
2) මෙහි උපකාරක අංක සඳහන් කර නොමැත. දිවි තොර කරගැනීමට උත්සාහ ගැනීමේ පුවතක් සමගින් හදිසි උපකාරක අංක සඳහන් කළේ නම්, දිවි තොර කරගැනීමේ නැඹුරුවකින් යුතු තවත් අයෙකු එම අංක ඔස්සේ උපදේශන සහාය ලබාගැනීමට ඉඩ ඇත. ඒ ඔස්සේ තවත් ජීවිතයක් බේරා ගැනීමට අවකාශය ලැබෙනු ඇත.

එසේම, මෙම පුවත්පත් වල සහෝදර ඉංග්‍රීසි පුවත්පත් තුළ, මෙම දිවි තොර කරගැනීමට උත්සාහ කිරීම පිළිබඳ පුවත් වාර්තා වී නොතිබුණි.

හදිසි උපකාරක අංක:
CCCline - 1333
ශ්‍රී ලංකා සුමිත්‍රයෝ - 0112682535, 0112682570, 0112818860
ජාතික මානසික සෞඛ්‍ය ආයතනය - 1926 (දුරකථන ඇමතුම් හෝ කෙටි පණිවිඩ මාර්ගයෙන් සම්බන්ධ කර ගත හැක)

උපකාරක අංකයක් පළ කරමු, ජීවිතයක් රැක ගනිමු!

මූලාශ්‍ර:
https://www.imediaethics.org/the-ethics-of-reporting-on.../
https://ethics.journalists.org/.../mental-health-and.../
https://accountablejournalism.org/.../australia-standards...